# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/66 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

**දකුණු පළාත් සභාවේ 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි ප්‍රඥප්තිය හා 2009 අංක 01 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග හා රෙගුලාසි**

1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ 41 වන වගන්තිය හා 2009 අංක 01 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්ති බලතල ප්‍රකාරව දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක හා ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල, එකී පළාත් සභාව විසුරුවා ඇති හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඇ) වගන්තියෙන් දකුණු පළාත් ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මා වෙත පැවරී ඇති හෙයින්, එකී බලතල ප්‍රකාරව පනවනු ලබන නියෝග හා රෙගුලාසි මෙමගින් ප්‍රසිද්ධ කරනු ලබන අතර, මෙම නියෝග හා රෙගුලාසි ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ සිට බල පැවැත්විය යුතුය.

ආචාර්ය **විලියම් විජේසිංහ ගමගේ,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2023 දෙසැම්බර් මස 08 වැනි දින,
දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

**නියෝග**

01. මෙම නියෝග "2023 අංක 01 දරන මගී සේවා අවසර පත්‍ර හා අනෙකුත් ගාස්තු අයකිරීම් පිළිබඳ නියෝග" වශයෙන් නම් කරනු ලැබේ.

02. මෙම නියෝග දකුණු පළාත් සභාවේ "2015 අංක 01 දරන මගී සේවා අවසර පත්‍ර හා අනෙකුත් ගාස්තු අයකිරීම් පිළිබඳ නියෝග" යටතේ අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තුව ඇතුළත් උපලේඛන අංක 04 යටතේ දක්වා ඇති අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තු සංශෝධනය කිරීමක් වේ.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛන 04*

*අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තු*

මෙම උපලේඛනයේ I වන තීරුවේ දක්වා ඇති කිසියම් විෂයකින් යම් කාර්යයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණය විය යුතුය.

| *I තීරුව* | *II තීරුවේ* |
|---|---|
| *කාරණය* | *ගෙවිය යුතු ගාස්තු* ප්‍රමාණය |
| | රු. ශත |
| 01. අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 1,000.00 |
| 02. මඟී සේවා අවසර පත්‍රයක් සඳහා බලපත්‍ර ගාස්තුව | 6,000.00 |
| 03. i. මඟී සේවා අවසර පත්‍රයක් නියමිත දිනට දීර්ඝ නොකිරීම නිසා අධිභාරය (මාස 06 කට වැඩිවන විට දීර්ඝ නොකරන ලද මුල් මාසයේ සිට 2,000.00 බැගින්) | 2,000.00 |
| 04. අතුරු මාර්ග සටහනක් සඳහා (වර්ෂයකට හෝ ඉන් කොටසකට) | 2,500.00 |
| 05. මඟී සේවා අවසරපත්‍ර පොත (අනුපිටපතක් පෙර වැරදි සටහන් කොට නිකුත් කිරීම) | 5,000.00 |
| 06. මඟී සේවා අවසරපත්‍ර ලේබලය (අනුපිටපත) | 1,000.00 |
| 07. i. විශේෂ චාරිකා බලපත්‍ර දිනකට | 500.00 |
| ii. විශේෂ චාරිකා දිනකට වඩා වැඩිවන දිනයක් සඳහා | 200.00 |
| 08. i. තාවකාලික බලපත්‍ර (දිනකට) | 500.00 |
| ii. ධාවක ඉල්ලීම මත අත්හදා බැලීම සඳහා ධාවනයට තාවකාලික බලපත්‍ර (දිනකට) ලබා දීම | 500.00 |
| 09. බලපත්‍රයක් නිරවුල් කරදීම | |
| i. ආසන ධාරිතාව 42 හෝ ඊට වැඩි | 250,000.00 |
| ii. ආසන ධාරිතාව 30 සිට 41 දක්වා | 200,000.00 |
| iii. ආසන ධාරිතාව 30 ට අඩු | 150,000.00 |
| 10. බලපත්‍ර හිමියා මියගිය විට නීත්‍යානුකූල අයිතිය හිමිවන පුද්ගලයාට බලපත්‍රය පැවරීම (භාර්යාවට/ස්වාමියාට හෝ දරුවන්ට පමණි) | 20,000.00 |
| 11. බස්රථයක කාලසටහනක අනු පිටපතක් නිකුත් කිරීම | 250.00 |

| I තීරුව කාරණය ප්‍රමාණය | II තීරුවේ ගෙවිය යුතු ගාස්තු රු. ශත |
|---|---|
| 12. පොරොත්තු බලපත්‍ර සඳහා (පොරොත්තු බලපත්‍රයක් යනු ඒකාබද්ධ කාලසටහනට අනුව අඩුවන ගමන්වාර ධාවනයට නියමිතව ඇති බස්රථයට අදාළ බලපත්‍රයකි) | |
| i. දින 15 හෝ 15 කට වැඩි කාලසටහන් සහිත බලපත්‍රයක් බවට පත් කිරීම | 200,000.00 |
| ii. දින 8 ත් 14 ත් අතර කාලසටහන් සහිත බලපත්‍රයක් බවට පත් කිරීම | 150,000.00 |
| iii. දින 4 ත් 7 ත් අතර කාලසටහන් සහිත බලපත්‍රයක් බවට පත් කිරීම | 100,000.00 |
| iv. ධාවක ඉල්ලීම මත තනි ධාවන සටහන් චක්‍රීය කාලසටහනක් ලෙස සැකසීම | 200,000.00 |
| 13. අතිරේක ගාස්තු සටහන් නිකුත් කිරීම | 250.00 |
| 14. ධාවකයින්ගේ ඉල්ලීම මත කාර්ය චක්‍ර සංශෝධනය | මගී ඉල්ලුමට අනුව සංශෝධනය කිරීමේදී පමණක් ගාස්තු අය නොකෙරේ. |
| 15. බස්රථ මාරු කිරීම සඳහා | |
| i. පළාත් බස්රථ | 5,000.00 |
| ii. වසර 10 වඩා වැඩි බස්රථ | 15,000.00 |
| iii. අන්තර් පළාත් බස්රථ | 2,500.00 |
| 16. මාර්ග සංශෝධනය කිරීම සඳහා | |
| i. ග්‍රාමීය මාර්ගයකට සංශෝධනය කිරීමට | 5,000.00 |
| ii. a. A හෝ B මාර්ගයේ 10km වඩා වැඩි මාර්ග කොටසක් ආවරණය වන පරිදි දීර්ඝ කිරීම සඳහා | 250,000.00 |
| b. A හෝ B මාර්ගයේ 10km වඩා අඩු මාර්ග කොටසක් ආවරණය වන පරිදි දීර්ඝ කිරීම | 175,000.00 |
| iii. මාර්ග කෙටි කිරීම | 25,000.00 |
| iv. අන්තර් පළාත් මාර්ග සංශෝධනය කිරීම (අධිකාරිය නිර්දේශ ලබාදීමෙන් පසු ක්‍රියාත්මක වීමේදී) | 200,000.00 |
| 17. සේවා ගාස්තු (පළාත්) | 1,000.00 |
| 18. සේවා ගාස්තු හා පිවිසුම් ගාස්තු (අන්තර් පළාත්) | 1,500.00 |
| 19. සේවා ගාස්තු හා පිවිසුම් ගාස්තු (අධිවේගී මාර්ගය) | 2,500.00 |
| 20. සේවා ගාස්තු / පිවිසුම් ගාස්තු ගෙවීම ප්‍රමාද වීම | මාසික සේවා සමුච්චිත මුදලට සාපේක්ෂව පළමු මසට 10% ක් ද, දෙවන මසට 20% ක් ද, තුන්වන මසට 30% ක් ද වන පරිදි මාසිකව 10% බැගින් මාස සංඛ්‍යාව අනුව ප්‍රතිශතය වැඩිවන ප්‍රමාද ගාස්තුවක් අයකිරීම. |

| *I තීරුව* | *II තීරුවේ* |
|---|---|
| *කාරණය* | *ගෙවිය යුතු ගාස්තු* |
| ප්‍රමාණය | |
| | රු. ශත |
| 21. කාලසටහන් හෝ වෙනත් පරිගණක සටහන් ලබාගැනීම (මුද්‍රිත පිටපතක් සඳහා) | 100.00 |
| 22. සිසු සැරිය ගාස්තු (පොදු බස් සේවා යටතේ ක්‍රියාත්මක නොවන) | |
| i. නව සිසු සැරිය බස්රථයකට ගාස්තු | 40,000.00 |
| ii. සේවා ගාස්තු බස්රථයකට (මාසිකව) | 1,000.00 |
| iii. පිවිසුම් ගාස්තු බස්රථයකට (මාසිකව) | 1,500.00 |
| iv. වාර්ෂික බලපත්‍ර ගාස්තුව (බස්රථයකට) | 6,000.00 |
| v. ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 1,000.00 |
| 23. පාසල් සඳහා දුර සනාථ කිරීමේ ලිපියකට | 200.00 |
| 24. CCTV දර්ශන ලබා දීම සඳහා | |
| i. රාජ්‍ය ආයතන මගින් කරනු ලබන ඉල්ලීම මත | දර්ශන නොමිලේ නිකුත් කරන අතර ප්‍රවාහන ගාස්තු අයකෙරේ |
| ii. පෞද්ගලික ඉල්ලීම මත | 5,000.00 සහ ප්‍රවාහන ගාස්තු |
| 25. i. ගිවිසුම් ගත කාර්යාල සේවා වාරික ගෙවීම් පැහැර හැරීම සඳහා ප්‍රමාද දඩ (නොගෙවා සිටින සෑම මසක් සඳහාම) | 2,500.00 |
| ii. කාර්යාල සේවා ටෙන්ඩර් කිරීමේ ඉල්ලුම් පත්‍රයක ගාස්තුව | 500.00 |
| 26. රියදුරු හැඳුනුම්පත් ගාස්තු | |
| i. නව හැඳුනුම්පත් නිකුත් කිරීමේ ගාස්තු | 1,000.00 |
| ii. හැඳුනුම්පත් දීර්ඝ කිරීමේ ගාස්තු | 750.00 |
| 27. කොන්දොස්තර බලපත්‍ර ගාස්තු | |
| i. නව කොන්දොස්තර බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු | 1,000.00 |
| ii. කොන්දොස්තර බලපත්‍ර දීර්ඝ කිරීමේ ගාස්තු | 750.00 |
| iii. රියදුරු/කොන්දොස්තර පුහුණු පාඨමාලා ගාස්තු | 3,000.00 |
| 28. මගී සේවා අවසර පත්‍රයකින් බස්රථයක් නිදහස් කිරීමේ ගාස්තු | 2,500.00 |

| *I තීරුව* | *II තීරුවේ* |
|---|---|
| *කාරණය* | *ගෙවිය යුතු ගාස්තු* |
| ප්‍රමාණය | |
| | රු. ශත |
| 29. අවලංගු කරන ලද මගී සේවා බලපත්‍ර නැවත වලංගු කිරීමේ ගාස්තු (අවලංගු කළ දින සිට මාස 06 කට නොවැඩි කාලයක් තුළ පමණක් වලංගු කරන ලද බලපත්‍ර සඳහා පමණක් අදාළ වේ) | 100,000.00 |
| 30. කාර්යාල සේවා වාර්ෂික බලපත්‍ර - පළාත් (අන්තර් පළාත් කාර්යාල සේවා නිර්දේශ ලබාදීම 34.1(i) පරිදි වේ) | 40,000.00 |
| 31. ඔම්නි ලිපි නිකුත් කිරීම | 500.00 |
| 32. පාසල් සේවා (රජයේ ඉන්ධන සහනාධාර නොලබන) | |
| i. වාර්ෂික බලපත්‍ර ගාස්තු | |
| a. ආසන 20 ට අඩු | 2,500.00 |
| b. ආසන 21 ත් 30 ත් අතර | 5,000.00 |
| c. ආසන 31 සිට ඉහළට | 10,000.00 |
| ii. ඉල්ලුම්පත්‍ර ගාස්තු | 500.00 |
| iii. බලපත්‍ර අනුපිටපත් ගාස්තු | 250.00 |
| 33. කර්මාන්තශාලා | |
| i. වාර්ෂික ලියාපදිංචි ගාස්තු (බස්රථ සඳහා) | 10,000.00 |
| ii. වාර්ෂික ලියාපදිංචි ගාස්තු (වෑන්රථ සඳහා) | 3,000.00 |
| iii. මාසික ගාස්තු (බස්රථ සඳහා) | - |
| iv. මාසික ගාස්තු (වෑන්රථ සඳහා) | - |
| v. ඉල්ලුම්පත්‍ර ගාස්තු | 500.00 |
| 34. ඇටෝර්නි බලපත්‍ර ගාස්තු (ඇටෝර්නි බලපත්‍ර යටතේ සේවා ක්‍රියාත්මක කිරීමේ ගාස්තු) | 10,000.00 |

EOG 12- 0326

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.